ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## ශ්‍රී ලංකා - ඉන්දියා මිත්‍රත්ව පෙදෙස විවෘත කිරීම

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය සහ ශ්‍රී ලංකා - ඉන්දියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශයේ සහයෝගයෙන් 2024 අගෝස්තු 08 වන දින 'ශ්‍රී ලංකා - ඉන්දියා මිත්‍රත්ව පෙදෙස' ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ජාතික සඳුන් උයනේ දී විවෘත කරන ලදී.

2. මෙම විවෘත කිරීමේ උත්සවය 'ශ්‍රී ලංකා - ඉන්දියා මිත්‍රත්ව පෙදෙස' ශෛලමය ඵලකය ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ කතානායක මහින්ද යාපා අබේවර්ධන මහතා සහ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා විසින් නිරාවරණය කිරීමත් සමඟ ආරම්භ විය. අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා, ශ්‍රී ලංකා - ඉන්දියා පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමයේ නිලධාරීන් වන පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. ඒ. සුමන්තිරන් මහතා, ආචාර්ය වී. රාධාක්‍රිෂ්ණන් මහතා, ජගත් කුමාර සුමිත්‍රාරච්චි මහතා සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද ජාතික සඳුන් උයනේ ආරුක්කුවක හැඩයකට මුරුත පැළ සිටුවමින් මේ සඳහා සහභාගී වූහ.

3. අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මහතා විසින් 2024 ලෝක පරිසර දිනයේදී දියත් කරන ලද #Plant4Mother ව්‍යාපෘතියේ අංගයක් ලෙස පරිසරය සඳහා අචල කැපවීම අවධාරණය කරමින් මෙම වැඩසටහන සංවිධානය කරන ලදී. අග්‍රාමාත්‍ය මෝදි මහතා 2024 ජූනි 5 වන දින නව දිල්ලියේ බුද්ධ ජයන්ති උද්‍යානයේ බෝ පැළයක් සිටුවමින් මෙම ව්‍යාපෘතිය දියත් කරන ලදී. ඉන්දියාව තුළ මෙම ව්‍යාපෘතිය යටතේ 2024 සැප්තැම්බර් වන විට පැළ මිලියන 800ක් ද 2025 මාර්තු වන විට පැළ බිලියන 1.4ක් ද 'සමස්ත රජය' සහ

‘සමස්ත සමාජය’ යන ප්‍රවේශය  අනුගමනය කරිමින් සිටුවීමට අපේක්ෂා කෙරේ.

4. ‘ශ්‍රී ලංකා - ඉන්දියා මිත්‍රත්ව පෙදෙස’ විවෘත කිරීම දෙරට අතර පවතින දිගු කාලීන මිත්‍රත්වයට සාක්ෂ්‍යයක් වේ. අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායි සහ තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා ද්විපාර්ශ්වික හවුල්කාරීත්වය වඩා ඉහළ නැංවීමට සහ සවිමත් කිරීමට දෙරටෙහි දැක්ම ද මෙමගින් පිළිඹිබු වේ.

***

***කොළඹ***

***2024 අගෝස්තු 08***